# ලංසු කැඳවීමේ ආරාධනයයි.

## ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත
## ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා කොන්ත්‍රාත්තු සැපයීම - 2025

1. උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පළාත් සභා කාර්යාල සංකීර්ණයේ ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා සුදුසුකම්ලත් සහ අවශ්‍යතා සපුරා ඇති ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු සඳහා ආරාධනා කෙරේ.
2. කොන්ත්‍රාත්තුව ප්‍රධානය කරනු ලැබීම පිණිස සාර්ථක ලංසුකරු අසාදු ලේඛණගත නොවී සිටිය යුතුය.
3. මෙම කොන්ත්‍රාත්තුව සඳහා උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ට උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් වැඩිදුර විස්තර ලබාගත හැකි අතර 2025.01.08 සිට 2025.01.21 දින පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුල කාර්යාල දිනවලදී පළාත් සභා කාර්යාල සංකීර්ණයේ 4 වන මහලේ පිහිටි ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ලංසු ලිපි ලේඛන පරීක්ෂා කිරීමට හැකිය.(සම්බන්ධ කරගත හැකි දුරකථන අංක - 025 2235471)
4. 2025.01.08 සිට 2025.01.21 දින ප.ව 3.00 දක්වා උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සහකාර ලේකම් (මුදල්) වෙත ආපසු නොගෙවන රු.500/- ක ගාස්තුවක් ගෙවා ලංසු ලිපි ලේඛන කට්ටලයක් ලංසුකරුවන් හට මිලදී ගත හැකිය.
5. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසුපත් 2025.01.22 දින පෙ.ව 10.30 ට පෙර ලැබෙන සේ ප්‍රධාන ලේකම්/සභාපති,අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,4 වන මහල B, පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, උතුරු මැද පළාත් සභා සංකීර්ණය,හරිස්චන්ද්‍ර මාවත,අනුරාධපුර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ කල හැකිය.
6. ලංසු වලංගු වීම සඳහා රු.25,000.00 ක් මුදලින් ප්‍රධාන ලේකම් කාර්යාලයට ගෙවීමෙන් ලබාගන්නා ලංසු සුරක්ෂණය (රිසිට්පත) ලංසු ලියවිලි වල මුල් පිටපත සමග ඉදිරිපත් කල යුතුය.
7. ලැබෙන ලංසු 2025.01.22 දින පෙ.ව 10.30 ට විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගි විය හැකිය.
8. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ප්‍රධාන ලේකම්/සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය,
4 වන මහල B,
හරිස්චන්ද්‍ර මාවත,
අනුරාධපුර.